ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2023 අගෝස්තු 04 දිනැති අංක 04/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ අංක 4(iii) ඡේදයෙහි දැක්වෙන විධිවිධාන අනුව 263-1-1-0-1409-138 වැය විෂය යටතේ යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම් සඳහා වන වියදම් දැරිය යුතු බව නියමකර තිබියදී, ඊට පටහැනිව වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා වෙනුවෙන් රු.මිලියන 1.04 ක මුදලක් එම වැය විෂය යටතේ දරා තිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති බව හා ඉදිරියේදී පරීක්ෂාකාරීව නිවැරදි වැය විෂය යටතේ ගෙවීම් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වැය විෂයන් කාණ්ඩගත කර ප්‍රමිතිකරණය කරනු ලැබ ඇති ආකාරයට ගිණුම් ගත කිරීම හා අයවැය චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීම කළ යුතු අතර, මෙවැනි වැරදි වැළැක්වීමට ඵලදායී අභ්‍යන්තර පරීක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය.
(ii)	1201 වැය විෂය යටතේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා සඳහා වන පුනරාවර්තන වියදම් දැරිය යුතු වුවද, එම වැය විෂය යටතේ දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ නඩත්තු අංශයට අවශ්‍ය රු.244,005ක ඉන්වෙන්ට්‍රි අයිතම මිලදී ගෙන තිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති බව හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සේ සලකා මිලදී ගෙන ඇති බව.	- එම -

(iii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම් වෙනුවෙන් ගෙවා තිබුණු, එකතුව රු. මිලියන 1.78 ක්වූ වියදම්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු 263-1-1-0-1302 වැය විෂය යටතේ ගිණුම්ගත නොකර විවිධ සේවා වියදම් 263-1-1-0-1409-140 වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.	නිරීක්ෂණය පිළිගන්නා බව හා වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා වියදම ඉහළ ගොස් ඇති බැවින් හා ප්‍රතිපාදන හිඟතාවය නිසා මෙසේ ගිණුම්ගතකර ඇති බව සහ ඉදිරියේදී නිවැරදි වැය විෂය යටතේ ගිණුම්ගතකරන බව.	- එම -

(ආ) මූලධන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ලුණුගම්වෙහෙර නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ තිර රෙදි සවිකිරීමට, වැය විෂය 263-1-1-0-2001 යටතේ රු.මිලියන 5.83ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් ඒ සඳහා රු. මිලියන 5.39ක් 263-1-1-0-2104 වැය විෂය මගින් දරා තිබුණි.	ගොඩනැගිල්ලේ ආරම්භක වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වැය විෂයන් කාණ්ඩගත කර ප්‍රමිතකරණය කරනු ලැබ ඇති ආකාරයට ගිණුම් ගතකළ යුතු අතර, ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කරන බව තහවුරු වන ආකාරයේ අභ්‍යන්තර වැඩ පිළිවෙලක් සැකසීමත් කළ යුතුය.
(ii)	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 08 ක් විසින් ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා සඳහා 1201 වැය විෂය යටතේ වෙන්කර තිබුණු ප්‍රතිපාදනවලින් රු.301,514ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නඩත්තු අංශයට අවශ්‍ය මූලධන වියදම් යටතට ගැනෙන උපකරණ මිලදී ගැනීම සඳහා යොදවා ගෙන තිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති බව හා විගණන නිරීක්ෂණයේ සඳහන් කර ඇති ප්‍රාග්ධන භාණ්ඩ යන්න පාරිභෝගික හා නඩත්තු උපකරණ වශයෙන් හඳුනාගෙන මිලදී ගැනීම සිදුකළ බව.	මුදල් රෙගුලාසි 208(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඇ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අඟුණුකොළපැලැස්ස නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම- අදියර III යටතේ සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු	නිරීක්ෂණය පිළිගෙන ඇති බව හා 2025 වර්ෂයේදී නිවැරදිව සිගාස් ගිණුම් පද්ධතියේ ගිණුම්ගත කරන බව.	ගිණුම් ශේෂ නිවැරදිව වර්ගීකරණය කොට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර, මෙවැනි වැරදි සිදුවීම වලක්වා

	එකතුව රු.මිලියන 37ක් 9160 - කෙරී ගෙන යන වැඩ (WIP) ප්‍රධාන ලෙජර් ගිණුම යටතේ ගිණුම්ගත කළයුතු වුවත්, එය 9151 නේවාසික නොවන ගොඩනැගිලි ගිණුම යටතේ ගිණුම්ගත කර තිබීම නිසා, එම ප්‍රමාණයෙන් නේවාසික නොවන ගොඩනැගිලි වටිනාකම වැඩියෙන් හා කෙරීගෙන යන වැඩ වටිනාකම අඩුවෙන් දැක්වුණි.		ගැනීමට උචිත අභ්‍යන්තර පරීක්ෂාවක් ආයතනය තුළ ස්ථාපිත කළ යුතුය.
(ii)	අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් සඳහා වෙන් කර ඇති රජයේ නිවාසයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	නිරීක්ෂණ පිළිගෙන ඇති බව හා තක්සේරු වාර්තා ලැබුණු පසු එම වටිනාකම සිගාස් පද්ධතියට ඇතුළත් කරන බව.	මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි මූල්‍ය තත්ත්වය නිරූපනය කිරීම සඳහා වත්කම් නිවැරදිව තක්සේරු කර පොත් වලට ගැනීම කඩිනමින් සිදුකළ යුතුය.
(iii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ට්‍රැක්ටර් හයක, ට්‍රැක්ටර් ටේලර් පහක සහ මෝටර් බයිසිකල් විස්සක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	නිරීක්ෂණ පිළිගෙන ඇති බව හා මෙම වර්ෂයේදී නිසි ක්‍රමවේදයක් යටතේ තක්සේරු කරවා ගැනීමට හා මූල්‍ය නොවන වත්කම් යටතට ඇතුළත් කිරීමට සහ භාවිතා නොකරන වාහන විධිමත්ව අපහරණය කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගන්නා බව.	- එම -
(iv)	කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වූ ග්‍රාම නිලධාරි කාර්යාල 07ක් පවත්වාගෙන යන ඉඩම් හා ගොඩනැගිලි 07ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	මැනුම්කර වෙන්කර නොමැති බැවින් තක්සේරු කළ නොහැකි බව හා ඉදිරියේදී මිනුම් සිදුකර තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	- එම -
(v)	ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය පිහිටි ඉඩම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සේවා පියස ගොඩනැගිලි 36ක හා ඒවා පිහිටි ඉඩම් 36ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.	ඉඩම් තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් සිදුකර ඇති බව, ඉඩම් තක්සේරු කිරීම සඳහා පිඹුරුපත් හා අයිතිය සනාථ කිරීමේ ලේඛනද ඉල්ලුම් කර ඇති බව හා 2025.02.05 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සේවා පියස ගොඩනැගිලි 03ක් තක්සේරු කර ඇති බව.	- එම -

(ඈ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අඟුණුකොළපැලැස්ස නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර III යටතේ කොන්ත්‍රාත්කරුට අත්තිකාරම් ගෙවීම් හා පියවීම්, ජර්නල් සටහන් මගින් ගිණුම්ගත නොකිරීම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අත්තිකාරම් ශේෂය හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ශේෂය රු.මිලියන 8.47ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී වැඩ සඳහා අත්තිකාරම් ගෙවීමේදී අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව.	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය.

(ඉ) විගණන සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ඕකෙවෙල නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම ලෙස සිගාස් (CIGAS) ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර තිබුණු රු. මිලියන 24.8ක වටිනාකම තහවුරු කිරීමට අදාළ තක්සේරු වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	දළ තක්සේරු අගයක් යටතේ අදාළ වටිනාකම සිගාස් පද්ධතියට ඇතුළත් කර ඇති බව හා තක්සේරු වාර්තා ලැබුණු විගස නිවැරදි වටිනාකම සිගාස් පද්ධතියට ඇතුළත් කරන බව.	වටිනාකම නිවැරදිව තහවුරු කිරීමට අදාළ තක්සේරු වාර්තා විගණනය වෙත කඩිනමින් ඉදිරිපත් කළ යුතුය.
(ii)	අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් ලෙස සිගාස් (CIGAS) පරිගණකගත ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර තිබුණු එකතු වටිනාකම රු.මිලියන 7.29 ක්වූ ඉඩම් හා ගොඩනැඟිලිවලවල හිමිකම සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තා අනුව වටිනාකම සිගාස් පරිගණක පද්ධතියට ඇතුළත් කළ බව.	හිමිකම තහවුරු කිරීමට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු 1.6.1 (අ) ii, iv, 1.6.1 (ආ) i, iv, 1.6.1 (ඇ) ii, iii, iv, v හා 1.6.1 (ඉ) i, ii ඡේදවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**අයවැය ඇස්තමේන්තු සකස් කිරීම**		
(i)	සමාලෝචිත වර්ෂයේ වැය විෂය අංක 263-1-1-0-2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වෙනුවෙන් 2024 වාර්ෂික අයවැය මගින් රු.මිලියන 30.76ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු නමුත් ඉන් රු.මිලියන 14.97ක ඇස්තමේන්තුගත කාර්යයන් ඉටු කර නොතිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති බව හා ඇස්තමේන්තු සකස්කර තිබුණු නමුත් වර්ෂය තුල සිදුකළයුතු හදිසි අවශ්‍ය කාර්යයන් ඉටුකළ බව.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා නිසි සැලකිල්ලෙන් යුක්තව සකස් කළ යුතු අතර සුදුසු පරිදි සමාලෝචනය කර පූර්ණ උපයෝජනයට කටයුතු කළ යුතුය.
(ii)	2023 අගෝස්තු 04 දිනැති අංක 04/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4.1(iii)ඡේදය අනුව අත්‍යවශ්‍ය නඩත්තු පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ඇස්තමේන්තු මගින් වෙන්කර ගැනීම සිදුකළ යුතු බව දක්වා ඇතත්, ගොඩනැඟිලි සහ ඉදිකිරීම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් වැය විෂය යටතේ (2001) 2024 වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන අනුමත කර නොතිබියදී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක ඉදිකිරීම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 09කදී එකතුව රු.මිලියන 12.4ක් වැය කර තිබුණි.	නිරීක්ෂණ පිළිගෙන ඇති බව හා වර්ෂය තුල ඉටුකළ යුතු හදිසි කාර්යයන් ලෙස සලකා ඉටුකළ බව.	අයවැය චක්‍රලේඛයේ උපදෙස් අනුව ඇස්තමේන්තු සකස් කළයුතු අතර, අනුමත කාර්යයන් සඳහා ප්‍රතිපාදන යෙදවිය යුතුය. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට විධිමත් අභ්‍යන්තර වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය.

(ආ)	2023 අගෝස්තු 04 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2023 මගින්, හිඟ සම්පත් අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර වෙත යොමු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් රජයේ වියදම් හා මූල්‍ය සම්පත් ඉතා සැලකිලිමත්ව, මනා විනයකින් සහ වගකීමෙන් යුතුව කළමනාකරණය කළයුතු බව දක්වා ඇතත්, පහත සඳහන් අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.		
(i)	263-1-1-01-1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වැය විෂය යටතට නොගැනෙන සහ 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු රජයේ නිවාසයක් සඳහා භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීමට එකතුව රු.291,290ක වියදමක් උක්ත වැය විෂයෙන් දරා තිබුණි.	යොමුගත වැය විෂය යටතේ ලිපිද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සඳහා ඇස්තමේන්තු සකස්කර ඇති බව හා රජයේ ඉහළ නිලධාරීන් නිරන්තරයෙන් යන එන නිල නිවාස සඳහා අත්‍යවශ්‍ය නමුත් සීමිතව පැවති ද්‍රව්‍ය හා උපකරණ ඉල්ලුම් කර ඇති නිසා එම උපකරණ හා ද්‍රව්‍ය මෙම විෂය යටතේ මිලදී ගෙන ලබාදුන් බව.	අයවැය චක්‍රලේඛයට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි වැය විෂයයක් යටතේ පුද්ගලික පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී නොගෙන ප්‍රතිපාදන වෙන්කර ඇති කාර්යයන් සඳහා පමණක් එකී ප්‍රතිපාදන යෙදවීමට කටයුතු කළ යුතුය.
(ii)	ඉහත සඳහන් චක්‍රලේඛයේ 1.3 ඡේදය අනුව වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සියලු ප්‍රයත්නයක් දැරිය යුතු බවත්, රාජ්‍ය මූල්‍ය අවකාශයේ සීමිත බව සහ හිඟ සම්පත් අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර වෙත යොමු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් රජයේ වියදම් අරපිරිමැසුම්දායීව හා කාර්යක්ෂමව කළමනාකරණය කිරීම ඉතා වැදගත් බව දන්වා තිබෙන අතර මුදල් රෙගුලාසි 128 (එ) හා 156(7) ප්‍රකාරව සකසුරුවම්භාවයෙන් කටයුතු කළයුතු බවද දක්වා තිබුණි. නමුත් එකී විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකර ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කර්යාලය විසින් ශ්‍රවණාගාරයේ වේදිකාව සඳහා තිරරෙදි යෙදීමට රු.මිලියන 5.39ක වියදමක් දරා තිබුණි. මහජන සේවා ඉටුකිරීම හා ප්‍රාදේශීය පරිපාලනය දැක්ම කරගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක අරමුණු ඉටුකර ගැනීමෙහිලා මෙවැනි වියදමක් දැරීමේ අවශ්‍යතාවයක් වියදම දරන අවස්ථාවේදී පැවතියේද යන්න ප්‍රශ්නකාරි විය.	ශබ්ද අවශෝෂක දැවමය පීඨිකාව සඳහා උචිත වන පරිදි හා එහි වටිනාකම තවදුරටත් වැඩි කල හැකි පරිදි ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන තිරරෙදි යොදා ගැනීම කාර්යාලයේ ශ්‍රවණාගාරයට අත්‍යවශ්‍ය වූ බැවින් එම වියදම දරා ඇති බව හා ඉදිරියේදී ශ්‍රවනාගාරය බාහිර පාර්ශව වෙත ගාස්තු අයකර ලබාදී රජයට ආදායම් අය කිරීමට බලාපොරොත්තු වන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ අරමුදල් සකසුරුවමින් සහ අරපිරිමැසුම් ලෙස හා කාලෝචිතව භාවිතා කිරීමේ වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

(ඇ)	මුදල් රෙගුලාසි 66/69 අනුව ප්‍රතිපාදන මාරුකිරීම්		
(i)	2023 අගෝස්තු 04 දිනැති අංක 04/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.7 (iv) ඡේදය අනුව, සංවර්ධන ව්‍යාපෘති යටතේ වන කාර්යයන් ආරම්භ කිරීමට ප්‍රථම එම කටයුතුවලට සම්බන්ධව සේවා සපයන ආයතන සමඟ දැනුවත්වීම් හා පූර්ව එකඟතාවයන් ඇති කර ගැනීමෙන් අනතුරුව කටයුතු ආරම්භ කිරීම අත්‍යවශ්‍ය බව දක්වා ඇතත්, 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන්කර නොගෙන, මුදල් රෙගුලාසි 66/69 යටතේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂයයෙන් (2104) රු. මිලියන 30ක ප්‍රතිපාදන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයට (2103) මාරුකර, සූර්යබල ශක්ති ව්‍යාපෘතියක් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණද, අනෙකුත් සම්බන්ධිත ආයතන විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 මගින් මාරු කරන ලද රු. මිලියන 30ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉතිරි වී තිබුණි.	සම්බන්ධිත ආයතන මගින් ව්‍යාපෘති ඉටු කිරීමට අවශ්‍ය පූර්ව කටයුතු ඉටු නොකිරීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමට අදාළ ඇස්තමේන්තුකරණයේදී, ප්‍රතිපාදන මාරුකිරීමේදී කාර්යක්ෂමව නිසි සැලකිල්ලෙන් සිදුකිරීමට කටයුතු කළ යුතු අතර, සම්බන්ධිත ආයතන මගින් ව්‍යාපෘති ඉටු කිරීමට අවශ්‍ය පූර්ව කටයුතු ඉටුවන බවට වගබලා ගැනීමෙන් පසු ව්‍යාපෘති සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	ඇස්තමේන්තුවල වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන, මුදල් වර්ෂය තුල වියදම් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව සහ වියදම් එම ප්‍රතිපාදන ඉක්මවා යාමට ඉඩ ඇති බව පෙනීයන විට අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ඉතිරිවීම් මාරු කළ හැකි බව මුදල් රෙගුලාසි 66හි සඳහන් කර තිබුණද, 2024 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2001 වැය විෂය යටතේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු ඉටුකළ යුතු බව දක්වමින් රු. මිලියන 1.3ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 අනුව මාරුකරවා ගෙන තිබුණද, එසේ මාරු කර ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 3.09ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.	සිදුකරමින් පවතින අලුත්වැඩියාවක් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන එහි බිල්පත් ඉදිරිපත් වීමට පෙර පවරා ගෙන වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීමට නොහැකි නිසා රු.1,300,000ක ප්‍රතිපාදන ලබාගත් බව.	ඉදිරි වර්ෂවල ඇස්තමේන්තු සැකසීමේදී හා ප්‍රතිපාදන මාරු කිරීමේදී රජයේ අරමුදල් සකසුරුවම් ලෙස සහ අරපිරිමැසුම් ලෙස භාවිතා වන පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතු අතර විධිමත් සමාලෝචනයකින් පසුව ප්‍රතිපාදන මාරු කිරීම කළ යුතුය.
(iii)	2023 අගෝස්තු 04 දිනැති අංක 04/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි 4.2 (ආ) ඡේදය අනුව 2023 ජුනි 30 දිනට සේවක සංඛ්‍යාව පදනම් කරගෙන එක් එක් නිලධරයන් සඳහා	ඉදිරි අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාළ චක්‍රලේඛ අනුව තථ්‍ය සේවක සංඛ්‍යාව පදනම්	- එම -

වෙන් වෙන්ව ගණනය කර 2024 වර්ෂයේ දීමනා සඳහා ඇස්තමේන්තු සකස් කළයුතු බවට උපදෙස් දී තිබුණ නමුත් එම කරුණු පිළිබඳ අවධානය යොමු නොකිරීම හේතුවෙන් (1203) ආහාර පාන හා නිල ඇඳුම් වැය විෂය සඳහා රු.600,000 ක ප්‍රතිපාදන වෙන්කර ගෙන ඉන් රු.372,000 ක් මුදල් රෙගුලාසි 66/69 අනුව වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.	කරගෙන ඇස්තමේන්තු සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	

3.2 සීමා නොපිළිපැදීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	සීමා ඉක්මවීම්		
(අ)	මුදල් රෙගුලාසි 503 (2) ප්‍රකාරව, යම් සීමා ඉක්මවීමක් සිදු වීමට ඉඩකඩ ඇති බව දැනගත් විට ඊට පෙර ඒ සඳහා අධිකාරි බලය ලබා ගත යුතු බවත්, 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි 10 ඡේදය මගින් අනුමත සීමාව තුල වියදම් කළමනාකරණය කර ගත යුතු බව දක්වා ඇතත්, එකී විධිවිධානවලට අනුකූල නොවී කටයුතු කිරීම නිසා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ රු. මිලියන 80 ක උපරිම වියදම් සීමාව ඉක්මවා රු.353,742 ක වියදම් දරා තිබුණි. මෙම සීමා ඉක්මවීම් සඳහා සීමා සංශෝධනය කරවා ගැනීමට රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය විසින් 2024 දෙසැම්බර් 31 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණද, විගණිත දින වූ 2025 මාර්තු 27 දින වන විටත් ඒ සඳහා අධිකාරිය ලැබී නොතිබුණි.	සීමා සංශෝධනය කර ගැනීමේ ලිපිය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය වෙත යොමු කර ඇති බව හා ඉදිරියේදී මෙවැනි සීමා ඉක්මවීමක් සිදුනොවීමට අදාළ වගකිව යුතු නිලධාරීන් දැනුවත් කළ බව.	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සීමා පිළිපැදීමට තරයේ කටයුතු කළයුතු අතර, එසේ කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ රු.මිලියන 162.4 ප්‍රතිපාදන මත රු. මිලියන 162.38 ක වියදමක් දරා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07 ක ක්‍රියාත්මක කර තිබුණු තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විධිමත් මාර්ගෝපදේශයක් සකස් කර නොතිබුණු අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකද පිහිටුවා නොතිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති බව හා මාර්ගෝපදේශයක් සකස් නොකළද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සකස් කළ පොදු උපදෙස් පත්‍රිකාව අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ බව.	ඉදිරියේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට විධිමත් මාර්ගෝපදේශයක් හා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක ක්‍රියාත්මක කළ යුතුය. තවද, ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී එහි තිරසර භාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
(ආ)	බිම්මල් ගම්මානයක් ස්ථාපිත කිරීම තුලින් හම්බන්තොට දිස්ත්‍රික්කය තුල බිම්මල් වගාව ව්‍යාප්ත කිරීමේ අරමුණින් අඟුණුකොළපැලැස්ස හා වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පිළිවෙලින් ප්‍රතිලාභීන් 31 දෙනෙකු හා දෙදෙනෙකුට බිම්මල් ගෘහ හා යන්ත්‍රෝපකරණ ලබාදීම වෙනුවෙන් රු.මිලියන 11.02ක් වැය කර තිබුණු නමුත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කාර්යසාධන දර්ශක හදුනාගෙන නොතිබුණු අතර කාර්යසාධනය මැන බැලීමක්ද සිදු කර නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘති පිළිබඳ ප්‍රමාණවත් හා ඵලදායි අධීක්ෂණයක් සිදු කර නොතිබුණි. වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභියෙකු වෙත බිම්මල් ගෘහයක් ඉදිකිරීමට රු.376,780 ක් ලබාදී තිබුණද, වෙනත් පාර්ශවයක් විසින් එහි බිම්මල් නිෂ්පාදන කටයුතු සුළු වශයෙන් සිදු කරමින් පැවතුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති අතර, අදාළ ප්‍රතිලාභීන් වෙත උපදෙස් ලබාදී ඇති බව.	අපේක්ෂිත අරමුණු ළඟා කර ගත හැකි පරිදි උපකරණ භාවිතයට ගන්නේද යන්න පිළිබඳ පසු විපරම් කළ යුතු අතර, නිසි සැලකිල්ලකින් කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	කෘෂි කර්මාන්තයේ තරුණයින් රඳවා ගැනීමේ වැඩසටහන යටතේ පැපොල් වගා ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 05 ක ප්‍රතිලාභීන් 80 දෙනෙකු සඳහා රු.මිලියන 12.55 ක් වූ පැළ හා උපකරණ ලබා දී තිබුණු නමුත් විගණනය විසින් පරීක්ෂාවට ලක් කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 ක පැළ වර්ධනය නොවීම, අපේක්ෂිත අස්වනු නොලැබීම, රෝග හට ගැනීම, වගාවන් ස්වාභාවික	පාරිසරික හා දේශගුණික තත්ත්වයන් මත ඇතැම් වගාවන් අසාර්ථක වී ඇති බව හා ඉදිරියේදී ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර උපදෙස් ලබා දෙන බව හා අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කරන බව.	රජයේ අරමුදල් ඵලදායීව උපයෝජනය කළ යුතු අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ගත හැකි පරිදි ව්‍යාපෘති සැලසුම් කළයුතු අතර, කාලීනව පසු විපරම් කළ යුතු අතර, එසේ නොකළ

	ආපදාවන්ට ලක් වීම, ප්‍රතිලාභීන් නැවතත් පැළ වගා නොකිරීම හා වගාව අත්හැරීම යනාදී කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි.		නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ඇ)	ආහාර සුරක්ෂිතතා වැඩසටහන යටතේ එළවළු වගාවේ ඵලදායීතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභියෙකුට ලබාදී තිබුණු රු.238,090 ක් වූ උපකරණ භාවිතා කර නොතිබුණු අතර තවත් ප්‍රතිලාභීයෙකු එම වටිනාකමින් යුතු උපකරණ අතුරින් දැල් කොටසක් පමණක් භාවිතා කර තිබුණු අතර ප්‍රතිලාභීන් දෙදෙනාම විගණිත දිනටත් වගාවන් ආරම්භ කර නොතිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති අතර, මේ වන විට අදාළ ද්‍රව්‍ය හා උපකරණ වගාව සඳහා යොදා ගන්නා බව.	අවශ්‍යතාව පවතින ප්‍රතිලාභීන් පිළිබඳ හඳුනාගෙන රජයේ අරමුදල් ඵලදායී ලෙස යොදවා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීමට විධිමත් අධීක්ෂණ හා පසු විපරම් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත් මෙවැනි ප්‍රතිලාභීන් ඇතුළත් කර අසාදු ලේඛනයක් පිළියෙල කිරීමටත් පියවර ගත යුතුය.
(ඉ)	ආහාර සුරක්ෂිතතා වැඩසටහන යටතේ එළවළු වගාවේ ඵලදායිතාවය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය සඳහා උපකරණ ලබා දී වසරකට ආසන්න කාලයක් ගත වී ඇතත් තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභියෙකුට ලබා දී තිබුණු කෘමි ප්‍රතිරෝධි දැල් හා විසුරුම් ජල සම්පාදන පද්ධතිය සහ තවත් ප්‍රතිලාභීන් දෙදෙනෙකුට ලබා දී තිබුණු රු.122,500ක් වූ ජල මෝටර් 02 ක් භාවිතයට ගෙන නොතිබුණි.	නිරීක්ෂණය පිළිගන්නා බව හා ප්‍රතිලාභීන් දෙදෙනෙකුට ලබාදී ඇති උපකරණ භාවිතා නොකරයි නම් නැවත පවරාගෙන සුදුසු ප්‍රතිලාභීන් වෙත ලබා දෙන බව හා එක් ප්‍රතිලාභියකු දැනට ලබාදුන් උපකරණ භාවිතා කරන බව.	- එම -
(ඊ)	2024 අප්‍රේල් මාසයේදී තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 06 දෙනෙකුට එකතු වටිනාකම රු.මිලියන 1.99 ක් වූ විජලන යන්ත්‍ර හා පෙති කැපීමේ යන්ත්‍ර ලබා දී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් හෝ සිදු කර නොතිබුණි. 2024 ඔක්තෝබර් 15 විගණිත දින වන විට පරීක්ෂාවට ලක් කළ ප්‍රතිලාභීන් දෙදෙනෙකු (02) සුළු වශයෙන් නිෂ්පාදන කටයුතු සිදුකරන බවත් තවත් ප්‍රතිලාභීයකුට කාල ප්‍රමාදයකින් පසු විගණිත දිනට ආසන්න දිනකදී විජලන හා පෙති කැපීමේ යන්ත්‍ර ලබා දී තිබූ බවත් නිරීක්ෂණය විය.	නිරීක්ෂණ පිළිගන්නා බව හා නම්කර තිබුණු ප්‍රතිලාභීන්ට සුදුසුකම් නොවූ බැවින් වෙනත් සුදුසු ප්‍රතිලාභීන්ට යන්ත්‍ර ලබාදුන් බව හා ඒ සඳහා යම් කාලයක් ගත වූ බව හා වෙළඳපල අවස්ථා හඳුනා ගැනීමට මහ පෙන්වීම් සිදුකරන බව.	අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යනයක්, විධිමත් අධීක්ෂණයක් හා පසු විපරම් ක්‍රියා මාර්ග නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

(උ)	අන්නාසි වගා ව්‍යාපෘතිය යටතේ වටිනාකම රු.399,910 ක් වූ පොලිතීන් වසුන් රෝල් 29 ක් අන්නාසි වගාවන් සඳහා යොදා ගැනීමට ප්‍රතිලාභීන්ට ලබා නොදී පොලිතින් රෝල් 15 ක් විගණිත දින වන විටත් නිෂ්කාර්යව වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති අතර ඉතිරිය මෙකී ව්‍යාපෘතියෙන් පරිබාහිර මිරිස් වගාකරුවන් වෙත ලබා දී තිබුණි.	නිරීක්ෂණ පිළිගන්නා බව හා පොලිතීන් වසුන් යෙදීම අනවශ්‍ය බැවින් ප්‍රයෝජනයට ගත හැකි වෙනත් ව්‍යාපෘති සඳහා ලබාදී ඇති බව.	අරමුණු ගත කාර්යට සම්පත් යොදා නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත්, ඉදිරියේදී අවශ්‍යතා හඳුනාගෙන භාණ්ඩ මිලදී ගැනීම සිදුකළයුතු අතර, රජයේ මුදල් අරපිරිමැස්මෙන් හා සඵලදායීව භාවිතා කිරීමේ වැඩ පිළිවෙලක් සැකසිය යුතුය.
(ඌ)	අන්නාසි වගා ව්‍යාපෘතිය යටතේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීයකුට ලබාදී තිබුණු අන්නාසි පැළ 1531 හා විසුරුම් ජල සම්පාදන පද්ධතිය සහ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීයකුට ලබා දී තිබුණු පැළ 1973 ක්, තණකොළ කපන යන්ත්‍රය හා විසුරුම් ජල සම්ප්‍රාදන පද්ධතිය වෙනත් පුද්ගලයින් දෙදෙනෙකු භාවිතා කරන බවත් එම අන්නාසි වගාවන් නිසි පරිදි නඩත්තු කර නොමැති බවත් නිරීක්ෂණය විය.	නිරීක්ෂණය පිළිගන්නා බව හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදුනොවන ලෙස කටයුතු කරන බව හා උපකරණ ප්‍රතිලාභියා භාවිතා කළයුතු බවට දැනුම්දී ඇති බව.	අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අධීක්ෂණය හා පසු විපරම් නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි පරිදි සුදුසු ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ ලබා දීමත් කළ යුතුය.
(එ)	සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අධිසනත්ව ක්‍රමවේදයට අනුව පේර වගා ආදර්ශන ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ රු.231,000ක වටිනා ප්‍රතිලාභ ලබා දුන් ප්‍රතිලාභියෙකුට ලබා දුන් පේර පැල වලින් සියයට පනහක් පමණ විනාශ වී තිබුණු අතර ඉතිරි පැල වලටද රෝගයක් හට ගෙන ඇති බවත්, වගා ක්‍රමය අනුව GI බට හා කම්බි භාවිතා කර නොතිබුණු බවත් ඒ අනුව රු.231,000ක දරා තිබූ වියදම නිෂ්කාර්ය වී තිබූ බවත් නිරීක්ෂණය විය.	නිරීක්ෂණ පිළිගන්නා බව හා ප්‍රතිලාභියා රෝගී තත්ත්වයෙන් පසු වන හේතුවෙන් වගා කටයුතු මඟහැරී ඇති බව සහ ඉදිරියේදී නිවැරදි කටයුතු කිරීමට දැනුවත් කර ඇති බව.	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවන්නේද යන්න පිළිබඳ නිලධාරීන් විසින් පසු විපරම් කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර එසේ නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ඒ)	සූරියවැව බැදිගංතොට ගම්මානයේ ප්‍රතිලාභීන් 21 දෙනෙකුට ඇපල් පේර අතු පැල 50ක්, බිංදු ජල සම්පාදන පද්ධතියක් බැගින් එකතුව රු.මිලියන 1.47ක් වූ උපකරණ හා පැල බෙදාදී තිබුණු අතර, බෙදාදී තිබුණු පේර පැල, ඇපල්පේර වර්ගයේ නොවන බවත්, ඒ හේතුවෙන් අපේක්ෂිත ආදායම් ප්‍රතිලාභීන්ට නොලැබෙන බවත් නිරීක්ෂණය විය.	නිරීක්ෂණ පිළිගන්නා බව හා අන්තර් පළාත් කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂක මගින් වාර්තාවක් ඉල්ලුම්කර ඇති බව සහ ඒ අනුව ප්‍රගතිය වාර්තා කරන බව.	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකි ආකාරයට ක්‍රියාමාර්ග ගත යුතු අතර, එසේ නොවන පරිදි මිලදී ගැනීම් සිදුකර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඔ)	අපනයනය සඳහා ඇඹුල් කෙසෙල් වගා ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03ක ප්‍රතිලාභීන් 200 දෙනෙකුට එකතුව රු.22,111,862ක්වූ කෙසෙල් පැළ සහ උපකරණ ලබා දී තිබූ නමුත්, 2024 ඔක්තෝබර් මාසය වන විට අපනයනය සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කර නොතිබුණ අතර කෙසෙල් අපනයනය කිරීමට රජයේ වෙනත් ව්‍යාපෘතියක් යටතේ රු.මිලියන 45.672ක් පමණ වැය කර ඉදිකර තිබුණු අපනයන මධ්‍යස්ථානය හා එහි ස්ථාපිත කර තිබූ යන්ත්‍ර සූත්‍ර නිශ්කාර්යව පැවතුණි. තවද, ප්‍රතිලාභීන්ට ලබාදී තිබුණු රු.මිලියන 1.58 වූ ප්ලාස්ටික් කූඩ හා කලර් රිබන් ඌන උපයෝජිතව තිබීම නිසා මෙම ව්‍යාපෘතියේ අරමුණුද ඉටුවී නොතිබුණි.	නිරීක්ෂණ පිළිගෙන ඇති බව හා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් විධිමත් පරිදි අපනයන කටයුතු සඳහා කිසිදු ආයතනයකට භාර නොදීම මත එම තත්ත්වය ඇතිවී තිබුණද, මේ වන විට යම් ප්‍රමාණයකට අපනයන කටයුතු ආරම්භ කර ඇති බව හා උපකරණ භාවිතයට ගැනීමට ප්‍රතිලාභීන්ට උපදෙස් ලබාදී ඇති බව.	ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය විධිමත්ව නොකළ නිලධාරීන්ට අදාළ පියවර ගත යුතුය.
(ඔ)	දැනට ක්ෂේත්‍රයේ පවතින ඇඹුල් කෙසෙල් වගාව අපනයනය සඳහා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සූරියවැව බැදිගංතොට ගම්මානයේ කෙසෙල් වගාව සිදු කරන ප්‍රතිලාභීන්ට බෙදා දීමට මිලදීගෙන තිබුණු එකතු වටිනාකම රු.381,437ක් වූ උපකරණ කාර්යාල පරිශ්‍රයෙන් බැහැර ස්ථානයක ගබඩා කර තිබියදී අස්ථානගත වී තිබුණු නමුත් ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	නිරීක්ෂණ පිළිගෙන ඇති බව මූලික පරීක්ෂණයේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව.	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ ආරම්භ කර, හානිය ප්‍රතිපූර්ණය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ක)	සූරියවැව බැදිගංතොට වසමේ රටකජු ව්‍යාපෘතිය යටතේ, රටකජු වගා වපසරිය වැඩි කිරීම, රටකජු බීජ සැකසීමේ වියදම අවම කිරීම, රටකජු ආශ්‍රිත වෙළඳපොළ කටයුතු පහසු කිරීම හා ව්‍යවසායකයන් වැඩි කිරීමේ අරමුණින් රු.121,500ක් වූ රටකජු බීජ වෙන් කිරීමේ යන්ත්‍රයක් ගොවි කණ්ඩායම් වෙත ලබා දීමට අපේක්ෂා කර තිබුණද, එක් ප්‍රතිලාභියෙකු වෙත පමණක් එම යන්ත්‍රය ලබා දී තිබීමෙන්, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගෙන නොතිබුණු අතර රු.25,000ක ගොවිදායකත්වය යටතේ යන්ත්‍ර නඩත්තු අරමුදලක් පිහිටුවීමට ව්‍යාපෘති ආයෝජන සැලැස්මේ දක්වා තිබුණු නමුත් එකී සැලැස්ම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	නිරීක්ෂණ පිළිගෙන ඇති බව හා ඉදිරියේදී ව්‍යාපෘති අරමුණු ඉටුකරගත හැකි ආකාරයට කටයුතු කරන බව.	අදාළ නිළධාරීන් මෙහෙයවා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කරවා ගැනීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

(ග)	කුරක්කන් පළුවලින් බීජ වෙන් කිරීමේ යන්ත්‍ර ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ, වගා වපසරිය වැඩිවීම, කුරක්කන් සැකසීමේ වියදම අවම කිරීම, ව්‍යවසායකයින් වැඩිකිරීම වැනි අරමුණු සහිතව රු.325,000ක් වූ යන්ත්‍රයක් ගොවි කණ්ඩායම් වෙත ලබා දෙන බව ව්‍යාපෘතියේ දක්වා තිබූ නමුත් එය සූරියවැව බැදිගංතොට වසමේ එක් ප්‍රතිලාභියෙකුට ලබාදී තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂයක පමණ කාලයක් ගත වී ඇතත්, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බවත්, ව්‍යාපෘති ආයෝජන සැලැස්ම යටතේ දක්වා තිබුණු රු.25,000ක ගොවි දායකත්වය යටතේ යන්ත්‍ර නඩත්තු අරමුදලක්ද පිහිටුවා නොමැති බවත් නිරීක්ෂණය විය.	නිරීක්ෂණ පිළිගන්නා බව හා අධීක්ෂණ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකිරීමට කටයුතු කරන බව.	- එම -
(ච)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05ක ප්‍රතිලාභීන් 05 දෙනෙකු වෙත එකක් රු.139,500ක් බැගින් රු.697,500ක් වටිනා සහල් පිටි නිෂ්පාදන යන්ත්‍ර ලබාදී, සහල් පිටි නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත්, අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම පිළිබඳ ඇගයීම් කිරීම සඳහා සුදුසු කාර්යසාධන දර්ශක හඳුනාගැනීම සිදුකර නොතිබුණු අතර ජනතාව සහල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොමුකර ඔවුන්ගේ පෝෂණ හා සෞඛ්‍ය තත්ත්වය ඉහල නැංවීම, සහල් ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම, විදේශ විනිමය ඉතිරි කිරීම, සෘජු හා වක්‍ර රැකියා ඇති කිරීම තුලින් ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය ඉහල නැංවීම, වැනි අරමුණු ඉටුකර ගත හැකි පරිදි සුදුසු යන්ත්‍ර මිලදී නොගැනීම හා මිලදීගත් යන්ත්‍ර ඵලදායි ලෙස භාවිතා නොකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු බවද නිරීක්ෂණය විය.	ව්‍යාපෘතිය ආරම්භක අවධිය බැවින් නියමිත අරමුණු කරා ළඟා නොවුනත් ඉදිරි වර්ෂවලදී ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලබාගන්නා බව හා ඉදිරියේදී තම රාජකාරි කටයුතු නිසි පරිදි ඉටුකිරීමට විෂය නිලධාරියාට ලිඛිතව උපදෙස් ලබාදුන් බව.	- එම -
(ඡ)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරා ගත් ගොවීන් 12 දෙනෙකුට ප්‍රතිලාභී දායකත්වය රු.500,000 ක් හා රජයේ දායකත්වය රු.489,000 ක් වන සේ එකතුව රු.මිලියන 11.87ක් වූ ට්‍රැක්ටර් බෙදාදීමේ වැඩසටහන සම්බන්ධයෙන් දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ගොවීන් ආවරණය වන පරිදි දැනුවත් කිරීම් සිදු කර විනිවිදභාවයකින් යුතුව ප්‍රතිලාභීන් තෝරාගත් බව නිරීක්ෂණය නොවුණු අතර, ට්‍රැක්ටර් 12න් 07ක් අඟුණුකොළපැලැස්ස හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රතිලාභීන්ට ලබා දී තිබුණු	සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජනය වන පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කින් පමණක් ඉදිරිපත් වී ඇති බව හා නිර්ණායක සපුරා ඇති ප්‍රතිලාභීන් පැමිණ මුදල් ගෙවූ ආකාරයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රතිලාභීන් සංඛ්‍යාව තෝරා	විනිවිදභාවයෙන් යුතුව ප්‍රතිලාභීන් තෝරා නොගැනීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, ව්‍යාපෘතිය තුලින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා නිලධාරීන් මෙහෙයවා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

	අතර, ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම තුලින් වී වගාව, එළවළු වගාව අතිරේක බෝග වගාව ආදි වගාවන්වල නිෂ්පාදන වියදම අඩුකර ආදායම ඉහල යාමක් අපේක්ෂා කර තිබුණද, එම අරමුණු ළඟා කරගෙන තිබූ බවට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.	ගැනීම සිදුකර ඇති බව හා ව්‍යාපෘතිය ආරම්භක අවධිය බැවින් ඉදිරි වර්ෂවලදී අරමුණු ළඟා කර ගැනීමට සැලසුම් කර ඇති බව.	
(ට)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07ක ප්‍රතිලාභීන් 233 දෙනෙකු සඳහා ඔවුන්ගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා රු.මිලියන 16.51 වැයකර එළුවන් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ අරමුණින් පරිබාහිරව සුරතලයට ඇති කිරීමේ අරමුණින් එළුවන් 66 දෙනෙකු ලබාගෙන තිබූ අතර, ප්‍රතිලාභීන් 36 දෙනෙකුට ලබාදී තිබුණු එළුවන් 91 දෙනෙකු අන්සතු කර තිබීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබුණු එළුවන් 699න් 113ක්, වර්ෂයක් වැනි කාලපරිච්ඡේදයක් තුල මිය ගොස් තිබූ අතර, අනතුරුව ලබාදී තිබුණු තවත් එළුවන් 19 දෙනෙකු මිය ගොස් තිබුණි. විවිධ හේතු නිසා රක්ෂණ වන්දි අහිමි වූ අවස්ථා ද පැවති අතර, තවද ගැහැණු සතුන් 102ක් සඳහා පැටවුන් ලැබී නොතිබුණි. එමෙන්ම ප්‍රතිලාභීන්ට ලබාදී තිබුණු එළු වර්ගය කිරි ලබාගැනීමට යෝග්‍ය වර්ගයේ එළුවන් නොවන බවත්, එළු කිරි ආශ්‍රයෙන් සහ මසට විකිණීමෙන් ආදායම් උපයා නොතිබීමෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණු බවත් නිරීක්ෂණය විය.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පසු විපරම් වාර්තා කැඳවීමට, ගිවිසුමේ ප්‍රකාරව එළුවන් තමා භාරයේ තබා නොමැති ප්‍රතිලාභීන් සම්බන්ධව නීති මඟින් කටයුතු කිරිමට ඇති හැකියාව පිළිබඳ අවශ්‍ය පියවර ගැනීම, ප්‍රතිලාභීන් දැනුවත් කිරීම හා ඉදිරියේදී ව්‍යාපෘතියේ අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය උපදෙස් හා පසුවිපරම් කටයුතු සිදු කරන බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා මනා සැලසුමකින් හා අධ්‍යනයකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති පාර්ශව සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම, ව්‍යාපෘතියේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකළ පාර්ශවයන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා පසු විපරම් කටයුතු දැඩිකර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කරවා ගැනීමට වැඩපිළිවෙලක් යෙදීම කළ යුතුය.
(ඩ)	හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ පවතින විද්‍යා හා තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානය සඳහා නිරවද්‍ය දත්ත පද්ධතියක් සකස් කර යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර 2021 වර්ෂයෙන් පසුව මධ්‍යස්ථානය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර හෝ නොතිබුණි. 2023 සහ 2024 වර්ෂ සඳහා ගොඩනැගිලි කුලී ලෙස එකතුව රු.372,000 ක් සහ මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2023 වර්ෂය හා 2024 වර්ෂයේ අගෝස්තු මස දක්වා එකතුව රු.මිලියන 3.12 වැටුප් ද ගෙවා තිබුණද මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වැඩසටහන් විද්‍යා මධ්‍යස්ථාන තුල ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදී නොතිබුණි.	නිරීක්ෂණය පිළිගන්නා බව හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම අමාත්‍යාංශයේ උපදෙස් හා ලබාදීමට යෝජිත ප්‍රතිපාදන හා අනුමැතිය අනුව සිදුවන බව. නිරීක්ෂණය පිළිගන්නා බව හා අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබා නොදුන්නද තාක්ෂණ පැවරුම් වැඩසටහන් සිදුකර ඇති බව.	යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමටත්, විද්‍යා මධ්‍යස්ථාන මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකි පරිදි සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කරවීමටත් පියවර ගත යුතුය.

(න)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ පිහිටුවා තිබුණු ග්‍රාම ශක්ති ජනතා සමිති අතුරින් අක්‍රිය සමිති 39 කට අදාළ ඉතිරි කිරීමේ ගිණුම්වල රු.මිලියන 10.88ක් වාර්තාවේ දිනට නිෂ්කාර්යව පැවති අතර, අක්‍රිය සමිති 03ක් විසින් සාමාජිකයින් 50 දෙනෙකුට ලබාදී තිබුණු එකතුව රු.840,344ක් වූ ණය වර්ෂ 03කට අධික කාලයක් හිඟව පවතින අතර, ක්‍රියාකාරී සමිති 05ක් විසින් සාමාජිකයින් 70 දෙදෙනෙකුට ලබාදී තිබුණු චක්‍රීය ණය මුදලින් එකතුව රු.666,990ක් වූ ණය හා පොළිය සැලකිය යුතු කාලයක් හිඟව පවතින බව නිරීක්ෂණය විය.	නිරීක්ෂණ පිළිගන්නා බව හා ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගෙන ඇති බව හා නිරීක්ෂණ පිළිගන්නා බව හා කඩිනමින් හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරන බව.	අක්‍රිය සමිති සක්‍රීය කර, අරමුණට යෙදවීම හෝ අදාළ අරමුදල් විධිමත් පරිදි පවරා ගැනීමත්, හිඟ ණය සහ පොළිය අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරිමත් කළ යුතුය.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
	i. මුදල් රෙගුලාසි 137(5) සහ 237(ආ)	14,010,371	යොමුගත රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවී හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතු වටිනාකම රු.14,010,371 ක් වූ භාණ්ඩ සැපයීම් සිදුකර නොතිබියදී 2024 දෙසැම්බර් මාසයේදී චෙක්පත් ලියා අතරඳවා ගෙන පැවති අතර, ඉන් එකතු වටිනාකම රු.4,921,371 ක් වූ භාණ්ඩ හා සේවා විගණිත දින වන වූ 2025 පෙබරවාරි 10 දින වන විටත් විටත් සපයා නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි කටයුතු සිදු නොවන අයුරින් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් නිලධාරීන් දැනුවත් කළ බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු අතර, ඊට අනුකූල නොවී කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

ii. මුදල් රෙගුලාසි 208 (2)(ඈ)	345,710	වෙන් කළ ප්‍රතිපාදන අදාළ කාර්යයන් උදෙසාම යෙදවිය යුතු වුවත්, ආහාර සුරක්ෂිතභාවය හා තාක්ෂණ වැඩසටහන යටතේ අඟුණකොළපැලැස්ස දේශීය ලේකම් කාර්යාලයට වෙන් කර තිබූ පරිපාලන වියදම්වලින් ඊට අදාළ නොවන නිලධාරීන්ගේ ගමන් වියදම් හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.	නිලධාරීන් අධෛර්මත් වීම වලක්වා ගැනීම සඳහා ඉහත වැඩසටහන යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් වැඩසටහනට පරිබාහිර වෙනත් කාර්යයන් සඳහා නිලධාරීන් මාසිකව ඉටු කරනු ලබන රාජකාරී වෙනුවෙන් මාසිකව ගෙවීම් කිරීමට ඉදිරිපත් කර තිබූ ගමන් වියදම් හා දින වැටුප් වවුචර් සඳහා ගෙවීම් කිරීමට කටයුතු කර ඇති බව.	ප්‍රතිපාදන වෙන්කර ඇති කාර්යයෙන් පරිබාහිරව වැය කළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

3.6 අවිධිමත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 අගෝස්තු 04 දිනැති අංක 04/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4.2(i) (අ) ඡේදයෙහි උපදෙස් අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණු 2024 වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු, සම්බන්ධීකාරක දීමනා යටතේ 2016 ජනවාරි මාසයේ සිට 2024 අප්‍රේල් මාසය දක්වා කාලය වෙනුවෙන් නිලධාරීන් තිදෙනෙකුට හිඟ සම්බන්ධීකාරක දීමනා ලෙස එකතුව රු.851,129 ක් සහ නිලධාරීන් සිව්දෙනෙකුට 2024 මැයි සිට දෙසැම්බර් දක්වා දීමනා ලෙස රු.120,000ක් වැටුප් හා දීමනා යටතේ ගෙවා තිබුණි. එමෙන්ම මෙකී වියදම් දැරීමේදී මුදල් රෙගුලාසි 136(1), 138(1), 138(6), 128(1) (එ) රෙගුලාසිවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවන පරිදි කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය විය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අධිකාරි බලය නොමැතිව සිදුකර ඇති ගෙවීම් නැවත අයකර ගැනීමටත්, අනීතික ලෙස ගෙවීම් කළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත් යුතුය.

3.7 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැඩ තහනම් කර ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් එකතුව රු.747,267ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු අතර, ඉන් එකතුව රු.513,223ක ණය ශේෂ වර්ෂ 03ක් 20ත් අතර කාලයකට අදාළ බව නිරීක්ෂණය විය.	නිලධාරීන් 02 දෙනෙකුගෙන් ණය ශේෂ අයකර ගත් බව හා ඉතිරි නිලධාරීන්ගෙන් ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව.	කාලීනව ණය ශේෂ අය කිරීමට පියවර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත්, ණය ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 07 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.667,932ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණු අතර, එම ණය ශේෂ සම්බන්ධයෙන් 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 3(ඉ) ඡේදය අනුව කටයුතු කර හෝ නොතිබුණි.	නිරීක්ෂණ පිළිගන්නා බව හා ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව.	- එම -

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන නියමු ව්‍යාපෘතිය මගින් සහල් පිටි නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 2.52ක ප්‍රතිපාදන අනුමත කර තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිරිවිතරවලට අනුකූල නොවන අඩු කාර්යක්ෂමතාවයකින් යුතු සහල් පිටි නිෂ්පාදන යන්ත්‍ර මිලට ගැනීම නිසා, වැඩසටහන සඳහා නිදහස් කර තිබුණ ප්‍රතිපාදනවලින් රු.මිලියන 1.8ක් නැවතත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබුණි.	ප්‍රතිලාභීන්ගේ කැමැත්ත මත අඩු කාර්යක්ෂමතාවයෙන් යුතු සහල් පිටි යන්ත්‍ර ලබා දුන් බැවින් ඉතිරි ප්‍රතිපාදන කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පවරා දුන් බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගත හැකි පරිදි වෙන්කර ඇති අරමුදල් ඵලදායි ලෙස උපයෝජනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 2 වන පරිච්ඡේදයේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම යටතේ 06 වන කරුණ මඟින් රු.මිලියන 172 ක ප්‍රතිපාදන භාවිතා කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 ක තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන සාර්ථකව නිම කිරීම තුළින් ජනතාවගේ ජීවනෝපාය ඉහළ නංවා ඇති බව දක්වා තිබුණද මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක පිහිටුවා නොතිබුණු අතර, ව්‍යාපෘති පිළිබඳ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි. එමෙන්ම ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණු අතර, ව්‍යාපෘති මගින් අපේක්ෂිත පරිදි අරමුණු ළඟා කරගෙන නොතිබුණි.	ව්‍යාපෘතියේ යම් යම් අඩුලුහුඩුකම් පැවතියද අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට අවශ්‍ය පියවර තවදුරටත් ගනිමින් පවතින බව.	ආයතනයේ කාර්යසාධනයට අදාළ නිවැරදි තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාව මගින් හෙළිදරව් කළ යුතු අතර එසේ නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

4.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2023 - වැල්දොඩම් වගා ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් 70 දෙනෙකුට රු.මිලියන 2.34ක් වැයකර ද්‍රව්‍යාධාර බෙදාදී තිබුණද, ප්‍රතිලාභීන් 47 දෙදෙනකු ව්‍යාපෘතියෙන් කිසිදු ආදායමක් උපයා නොමැති වීමෙන් ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභීන්ට ස්ථිර ආදායම් මාර්ග ඇතිකිරීමේ අරමුණු ඉටු වී නොමැති බවත් නිරීක්ෂණය විය.	පැල සිටුවීමෙන් පසුව හටගත් දිලීර රෝගයක් හා අධික වර්ෂා තත්ත්වයන් හේතුවෙන් පැල සුළු ප්‍රමාණයක් විනාශ වී ඇති බවත්, විනාශ වූ පැල වෙනුවට වෙනත් පැල සිටුවා වගා කටයුතු ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය උපදෙස් හා පසුවිපරම් කටයුතු සිදුකරන බව.	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගත හැකි ආකාරයට ප්‍රතිලාභීන් තෝරාගත යුතු අතර, පසු විපරම් කටයුතු විධිමත් කර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට වැඩපිළවෙලක් සකස් කළ යුතුය.

(ආ)	2023 ඔක්තෝබර් මාසයේදී ඉදිකිරීම් නිමකර තිබුණු අඟුණුකොළපැලැස්ස නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි බිත්තිවල ස්ථාන 141ක මීටර් 0.2 සිට මීටර් 6 දක්වා පරාසයක එකතුව මීටර් 147.25ක සහ ගෙබිමෙහි ස්ථාන 32ක වර්ගමීටර් 239.02ක පිපිරීම් / ඉරිතැලීම් පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	අදාළ අඩුපාඩු සම්පූර්ණ කරන මෙන් කොන්ත්‍රාත්කරු ලිඛිතව දැනුවත් කර ඇති බව.	නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉදිකිරීම් කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කළයුතු අතර, අඩුපාඩු පැවතියදී ගෙවීම් කළ කළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත්, ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර ගැනීමට පියවර ගැනීමත් කළ යුතුය.
(ඇ)	ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලෙහි බිත්තිවල, ගොඩනැගිල්ල වටා ඇති Pavement එකෙහි හා ඉහල මහලෙහි Water Proofing සිදු කර ඇති ගෙබිමෙහි ස්ථාන 40ක වර්ගමීටර් 182ක පමණ පිපිරීම්, ඉරිතැලීම් හා බොල්වීම් සිදුව තිබූ අතර, ගොඩනැගිල්ලෙහි ගෙබිම තීන්ත ආලේප කිරීම මනා නිමාවකින් යුතුව සිදු නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ල භාවිතයට ගත් මුල් අවස්ථාවේදීම ස්ථාන කිහිපයක් නැවත තීන්ත ආලේපයට රු.116,230ක් දරා තිබුණි.	අදාළ අඩුපාඩු පෙන්වා දීමෙන් පසු එම අඩුපාඩු සකස් කිරීමට කොන්ත්‍රාත් ආයතනය එකඟ වී ඇති බව.	- එම -
(ඈ)	ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උඩමත්තල කණිෂ්ඨ විදුහලේ අළුත්වැඩියා කටයුතු සිදුකිරීමේ ව්‍යාපෘතිය, ජයමග කුඩාගම්මාන 04 පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය හා දෙව්රම්වෙහෙර බෝගහවැව ප්‍රජා ජල ව්‍යාපෘතියේ ගලහිටියාව සිට ඉලුක්පැලැස්ස දක්වා පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ඉටුනොකළ, කාර්යයන් සඳහා රු.189,783ක් වැඩිපුර ගෙවා තිබුණි.	ඉටුකර නොමැති වැඩ සඳහා වැඩිපුර ගෙවීම් කරන ලද මුදල අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීම් වහාම අයකර ගැනීමටත්, ඊට අදාළ පාර්ශව සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමත් කළ යුතුය.
(ඉ)	හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රුවන්පුර රොටරි මාර්ගයේ දකුණුපස අඩක් නිම වූ කාණු පද්ධතිය සෑදීම, කපුවත්ත කටුවැව කෘෂි මාර්ගය හරහා ඇති කපුවත්ත බස්නාවට බෝක්කුවක් ඉදි කිරීමේ කර්මාන්තය සහ පල්ලෙමලල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හෙළ බොජුන්හල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා එකතුව රු.මිලියන 3.16ක් ගෙවා තිබුණි. කෙසේ නමුත් කොන්ක්‍රීට් යොදා සිදු කරනු ලබන ඉදිකිරීම්වල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වඩාත් ප්‍රශස්ථ කොන්ක්‍රීට් කියුබ් පරීක්ෂාව සිදු නොකර පරීක්ෂාව Reborn Hammer Test ආකාරයෙන් සිදුකර ගෙවීම් කර තිබුණි.	මේ සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා වෙතින් කරුණු පැහැදිලි කර ගැනීමක් සිදුකර වාර්තා කරන බව හා Reborn Hammer Test යනු ඕනෑම අවස්ථාවක ඉතා ඉහළ ප්‍රශස්තතාවක් ඇති තත්ත්ව පරීක්ෂණයක් බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර ඉදිකිරීම්වල ප්‍රමිතිය පිළිබඳ තහවුරු කර ගත යුතුය.

(ඊ)	කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2023 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රු.මිලියන 06ක ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කළ කටුවන මැදකන්ද දොලේදෙනිය ඇළ මාර්ගය සඳහා පෙට්ටි බෝක්කුව ඉදිකිරීම ව්‍යාපෘතියට අදාළ තත්ත්ව පරීක්ෂණයේදී කොන්ක්‍රීට් **කියුබ්** අපේක්ෂිත සම්පීඩ්‍යතා මට්ටමට වඩා අඩු බවට තහවුරුව තිබියදී, අතරුදවුම් මුදල් අඩුකර රු.මිලියන 3.35ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.	දිස්ත්‍රික් ඉංජිනේරු විසින් ලබා දුන් උපදෙස් පරිදි Hammer Test පරීක්ෂාව සිදු කර ගෙවීම් සිදු කළ බව.	ඉදිකිරීම් ඇස්තමේන්තු ප්‍රකාරව නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉටුකළ පසු ගෙවීම් කළයුතු අතර, එසේ කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(උ)	තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මැදිරිගිරිපුර ගම්මානයේ මාර්ගය කොන්ක්‍රීට් කිරීම, රෝහණපුර සුසාන භූමිය අසල සිට අතුරු මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම යනාදී ව්‍යාපෘතිවල පරීක්ෂාවට ලක් කළ කොන්ක්‍රීට් කියුබ්, අපේක්ෂිත සම්පීඩ්‍යතා ශක්ති ප්‍රමාණයට වඩා අඩුවීම හේතුවෙන්, ඒ සඳහා ප්‍රශස්ත පරීක්ෂාවක් නොවන Reborn Hammer Test සිදුකර ඒ මත පදනම්ව එකතුව රු.මිලියන 3.36ක් ගෙවා තිබුණි. තවද ඉදිකළ මැදිරිගිරිපුර මාර්ගයේ ස්ථාන 07ක වර්ගමීටර් 35ක පමණ ඉරිතැලීම්/පිපිරීම් සිදුව තිබුණි. තවද, මාර්ගයේ පාදම සහ උරහිස් සඳහා පස් යෙදීම සඳහා දකුණු පළාත් මාර්ග මිල ගණන් ලේඛනයේ ඇතුළත් යාන්ත්‍රික රේටය යොදා නොගෙන හස්ත රේටය යොදාගෙන ඇස්තමේන්තු කර ගෙවීම් කිරීම හේතුවෙන් රු.71,094ක පාඩුවක් ද සිදුවී තිබුණි.	දිස්ත්‍රික් ඉංජිනේරු විසින් ලිඛිතව ලබා දුන් උපදෙස් මත ගෙවීම් කර ඇති බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර නිසි ප්‍රමිතියෙන් තොර ඉදි කිරීම් සඳහා ගෙවීම් කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත් පවතින අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් සිදුකළ අඩු ආදායම්ලාභී පවුල් වෙත නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් වෙත නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන සඳහා රු.මිලියන 431.04ක් වූ සහල් කි.ග්‍රෑම් 2,317,400ක් මිලට ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබූ අතර, නිලධාරීන් විසින් මූල්‍ය ගනුදෙනු නිසි පිරිමැසුම්භාවයෙන් සිදු නොකිරීමෙන් වැඩසටහනේ I අදියර සඳහා රජයට රු.මිලියන 34.9ක පාඩුවක් සිදු වී තිබුණි.	ජාතික තරඟකාරී ලංසු කැඳවා කටයුතු කිරීමට ප්‍රමාණවත් කාලසීමාවක් නොමැතිවීම හා රජයේ නිවාඩු දින සංඛ්‍යාව වැඩිවීම මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 ඡේදයට අනුව කටයුතු සිදුකිරීමට නොහැකි වූ බව හා කඩිනමින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සිදුවීම හේතුවෙන් ප්‍රාදේශීය	විධිමත් පරීක්ෂණයක් පවත්වා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, රජයට සිදු වී ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.

		ලේකම් කාර්යාල විසින් සහල් ලබාගෙන බෙදාහැරීම් සිදුකළ බව හා උක්ත චක්‍රලේඛයේ 2.3.2 යටතේ සඳහන් කර ඇති පරිදි සහතික මිලගණන් යටතේ ප්‍රමිතියෙන් යුතු සහල් මිලදී ගැනීම සිදුකළ බව.	
(ආ)	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන නියමු ව්‍යාපෘතිය යටතේ, සහල් පිටි නිෂ්පාදන යන්ත්‍ර 05ක් මිලදී ගැනීමේදී, ලංසු කැඳවීමේ ලේඛනයේ දක්වා තිබුණු තාක්ෂණික පිරිවිතර ඇගයීමට ලක් නොකර, එම පිරිවිතර වලට අදාළව එවනු ලැබූ මිලගණන් ප්‍රතික්ෂේප කර, නියමිත පිරිවිතරවලට වඩා අඩු කාර්යක්ෂමතාවයකින් යුතු යන්ත්‍රය ලබාගෙන තිබීමෙන් රජයට රු.148,500ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. තවද, මෙම මිලදී ගැනීමේදී ලංසු ඇගයීමේ පරමාර්ථ සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයෙහි සඳහන් ප්‍රසම්පාදන අරමුණු ඉටුවී නොමැති බවද නිරීක්ෂණය වේ.	නිරීක්ෂණ පිළිගන්නා බව හා ප්‍රතිලාභී අවශ්‍යතාවය මත 10HP සහල් ඇඹරුම් යන්ත්‍ර වෙනුවට 3HP සහල් ඇඹරුම් යන්ත්‍ර අවශ්‍යතාවය මත පදනම්ව තාක්ෂණික ඇගයීම් සිදුකළ බව.	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7 ඡේදයේ විධිවිධාන අනුව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, සිදුවී ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු බව.
(ඇ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය වාහන සඳහා රු.980,000ක් වූ රිවස් කැමරා 14 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවක සහාය නොගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණු අතර රිවස් කැමරා සඳහා මිලගණන් කැඳවීමට අදාළ පිරිවිතර සම්පූර්ණ කළ ඒකකයක් රු.44,000 බැගින් මිලට ගැනීමට හැකියාව තිබියදී ඒකකයක් රු.70,000 බැගින් එකතුව රු.980,000 ක් වටිනා කැමරා 14ක් මිලට ගැනීම නිසා රු.364,000ක පාඩුවක් සිදුව තිබුණු අතර, එසේ රු.70,000 බැගින් මිලදී ගැනීම සඳහා පදනම් වූ හේතු ද ප්‍රසම්පාදන තීරණය මගින් පැහැදිලි කර නොතිබුණි.	නිරීක්ෂණ පිළි නොගන්නා බවත්, යාන්ත්‍රික ඉංජිනේරු වෙතින් ලබාගත් නිර්දේශය මත තාක්ෂණික කමිටු නිර්දේශයකින් තොරව ප්‍රසම්පාදන මණ්ඩල තීරණය පරිදි මිලදී ගෙන ඇති බවත්, මූලික පිරිවිතර සම්පූර්ණ කිරීම පමණක් සලකා බැලීම නොකළ අතර, වගකීම් කාලය හා වෙළඳපොළ නම සැලකිල්ලට ගෙන රිවස් කැමරා තෝරාගෙන ඇති බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු වී ඇති පාඩුව පියවා ගත යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම්වරයා සඳහා වෙන්කර ඇති රජයේ නිවාසයේ පැරණි බඩු වට්ටෝරු ලේඛනය වෙනුවට 2024 වර්ෂයේදී නව බඩු වට්ටෝරු ලේඛනයක් පිළියෙල කර තිබුණු අතර, පැරණි හා නව බඩු වට්ටෝරු ලේඛන අනුව ශේෂ පරීක්ෂාවේදී භාණ්ඩ වර්ග 63 ක ඒකක 220 ක ඌනතාවයන් හා භාණ්ඩ වර්ග 21 ක ඒකක 70ක අතිරික්තතා නිරීක්ෂණය වූ අතර, ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පැරණි හා නව බඩු වට්ටෝරු ලේඛනවල පවතින ඌනතා හා අතිරික්තතා සම්බන්ධව පරීක්ෂා කර බැලීම සඳහා කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදුකරන බව.	ඌනතා සම්බන්ධව මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු අතර, අතිරික්ත භාණ්ඩ විධිමත්ව ලේඛනයට ඇතුළත් කර බඩු වට්ටෝරු ලේඛනය විධිමත්ව හා නිවැරදිව යාවත්කාලීනව පවත්වා ගත යුතුය.
(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කැබ් රථයක්, ත්‍රීරෝද රථයක් සහ මෝටර් බයිසිකල් 13ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.	ඉදිරි මාස තුනක කාලයක් තුල වාහන විධිමත්ව අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	රථ වාහන නිශ්කාර්යව නොතබා ඵලදායී ලෙස භාවිතයට ගැනීම හෝ විධිමත් පරිදි අපහරණය කිරීම කළ යුතුය.
(ඇ)	බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් සඳහා වෙන්කර ඇති රජයේ නිවාසය අලුත්වැඩියා සඳහා සමාලෝචිත වර්ෂයේදී, රු.මිලියන 4.12ක් දරා තිබුණද, නේවාසික කාර්යයන් සඳහා එම නිවාසය භාවිතා නොකර කාර්යාලයේ ගබඩා පහසුකම් සඳහා වෙන් කර තිබුණු අතර, සහකාර ප්‍රාදේශීය ලේකම් සඳහා වෙන් කර ඇති නිවාසය සමාජ සේවා අංශය පවත්වා ගෙන යාමටද භාවිතා කර තිබුණි. තවද, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 02 කාර්යාලයේ ගබඩා පහසුකම් සඳහා යොදාගෙන තිබූ බවත්, නිරීක්ෂණය විය.	අදාළ කාර්යාලයේ පවතින ඉඩ පහසුකම් සීමිතවීම නිසා කාර්යාලය ආසන්නයේම නිවාස පිහිටා තිබීම නිසා කාර්යාල අවශ්‍යතා සඳහා නිවාස යොදාගෙන ඇති බව හා ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර නිල නිවාස භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	අරමුණුගත කාර්යයන් සඳහා රජයේ නිවාස යොදා ගත යුතුය.
(ඈ)	2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි 7.5 ඡේදය අනුව රජයට අයත් ඌන උපයෝජිත ගොඩනැගිලි ප්‍රශස්ත ලෙස උපයෝජනය කළයුතු බව සඳහන්ව තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5ක රජයේ නිවාස 07ක් නේවාසික කාර්යය සඳහා යොදා නොගෙන ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.	අබලන් තත්ත්වයේ පවතින බව හා ඉදිරියේදී අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව.	අරමුණුගත කාර්යයන් සඳහා රජයේ නිවාස යොදා ගත යුතුය.

4.6 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි දේපලවලට හානි කිරීම හා සේප්පුවෙහි මුදල් සොරා ගැනීම සම්බන්ධව, මුදල් රෙගුලාසි 104 ප්‍රකාර අවසන් පරීක්ෂණ මණ්ඩල වාර්තාව මගින් රු.මිලියන 1.94ක අලාභය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආරක්ෂක සේවා සැපයූ ආයතනයෙන් සහ එම කාර්යාලයේ රජයේ නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයකරගත යුතු බවට නිර්දේශ කර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම අලාභයෙන් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.	නිලධාරීන් ඉදිරිපත් කර ඇති අභියාචනා පිළිබඳව ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ ආරක්ෂා සේවා සැපයූ ආයතනය මුදල ගෙවීම් කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති බව.	රජයට සිදුවී ඇති පාඩුව අප්‍රමාදව පියවා ගත යුතුය.
(ආ)	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 04ක අනතුරුවලට අදාළ රු.220,479ක අලාභ හානි සම්බන්ධව මුදල් රෙගුලාසි 105 (2) ප්‍රකාරව අයකරගත යුතු මුදල නිර්ණය කරමින් හා ඒ ඒ අලාභ හානිය සඳහා වගකිව යුතු නිලධාරීන්ද ඒ එක් එක් නිලධාරියාගෙන් අයකර ගත යුතු මුදල් ප්‍රමාණය නිර්ණය කරමින් ඒ අලාභහානි වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද, අනතුරු සිදුවී වසර 06ක කාලයක් ඉක්මවා තිබුණද අදාළ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	අලාභ හානිය සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ගෙන් හා තෙවන පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ලිඛිතව දැනුම්දුන් බව.	පාඩුව අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, සිදු වී ඇති හානිවලට අදාළ වටිනාකම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය.
(ඇ)	අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු කැබ් රථයක් 2023 වර්ෂයේදී අනතුරකට පත්වීම නිසා එය රු.95,000ක් වැය කරමින් අලුත්වැඩියා කර තිබූ නමුත් හානිය සිදුවූ අවස්ථාවේදී රක්ෂණ හිමිකම ඉල්ලුම් කරන පෝරමයෙහි අනතුර සිදුවූ ආකාරය පිළිබඳ සඳහන් නොකිරීම හේතුවෙන් රක්ෂණ ආයතනය විසින් රක්ෂණ හිමිකම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ අනුව රාජකාරිමය නොසැලිකිල්ලෙන් කටයුතු සිදුකළ නිලධාරීන්ගෙන් අදාළ අලාභය අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.	රක්ෂණ හිමිකම ඉල්ලුම් කිරීමේදී අනතුර සිදුවූ ආකාරය සඳහන් කර නොතිබූ බැවින් අදාළ රක්ෂණ ආයතනය රක්ෂණ හිමිකම පිළිගෙන නොමැති බව.	වගකිව යුතු පාර්ශවයන්ගෙන් රජයට සිදු වූ පාඩුව අයකර ගත යුතුය.

4.7 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව එකතුව රු.මිලියන 1.66ක් වූ ගැනුම් මිල බලපත්‍ර ගාස්තු හා දඩ පොළිය සහ 2024 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු රු.320,000 ක් 2024 ඔක්තෝබර් 09 විගණිත දින වනවිටත් හිඟව පැවතුණි.	බදු විෂය නිලධාරියා අනුප්‍රාප්තිකයෙකු රහිතව ස්ථාන මාරු වී යාමෙන් පසුව එම විෂය පිළිබඳ දැනුමක් සහිත නිලධාරියෙකු නොමැති වීමෙන් හිඟ බදු මුදල් අය කිරීම සිදු නොවී ඇති බව හා නිලධාරියෙකු ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඉඩම් කොමසාරිස් වෙත ලිපි යොමු කර ඇති බව සහ අයකර ගැනීම් කටයුතු නිවැරදිව කිරීමට කටයුතු කරන බව.	හිඟ බදු හා දඩ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අඹගස්ආර වසමේ අක්කර 02ක පමණ රජයේ ඉඩමක් එළිකර අනවසරයෙන් සිදුකර ගෙන යන වගාවක් පිළිබඳව 2023 මාර්තු මස ග්‍රාම නිලධාරි විසින් වාර්තා කර ඇතත්, විගණන දිනය වූ 2024 නොවැම්බර් 11 දින වන විටත් අනවසරකරු ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සියලුම අනවසරකරුවන් එකවර ඉවත් කිරීම සඳහා නැවත ආ.ඒ.60 වාර්තාවක් ලබා ගැනීමට ග්‍රාම නිලධාරී වෙත දැනුම්දී ඇති බව.	අනවසරකරු ඉවත් කිරීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමත්, අනවසරකරු ඉවත් කිරීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය
(ඇ)	ගමනැඟුම වැඩසටහන 2011 යටතේ කට්ටකඩුව දකුණ වාඩියගොඩ කුඹුරුයායට පිවිසෙන මාර්ගය කොන්ක්‍රීට් කැට අල්ලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා ප්‍රතිපාදන අනුමත වීමට පෙර, ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා තංගල්ල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2011 නොවැම්බර් 30 දින ගොවි සංවිධානයක් සමඟ රු.437,799 ක මුදලකට ගිවිසුම්ගතවී තිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර, සංවර්ධන කටයුතු සිදුකරන භූමියේ හිමිකරුගේ එකඟතාවය විධිමත්ව ලබාගෙන නොතිබීමෙන් , 2024 වර්ෂය වන විටත් ඉඩමේ හිමිකරු එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විරෝධතා දක්වමින් සිටින බව නිරීක්ෂණය විය.	විගණන නිරීක්ෂණ පිළිගන්නා බව හා ඉඩම සම්බන්ධයෙන් වන්දි ලබාදීමට සුදුසු බවට තංගල්ල ප්‍රාදේශීය සභාවට දන්වා ඇති බව.	රජයේ සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමට ප්‍රථමව අදාළ පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබා ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11ක් මගින් විශ්‍රාමිකයන් 36 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු.මිලියන 8.89ක විශ්‍රාම වැටුපෙන් 2024 දෙසැම්බර් 31 දින වන රු.මිලියන 5.32ක මුදලක් අයකර ගත යුතුව තිබුණි.	නිරීක්ෂණය පිළිගන්නා බව හා තවදුරටත් රු.4,757,007ක මුදලක් අයවිය යුතු බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර නිලධාරීන් අවභාවිතාවක් කර ඇත්නම් ඊට අදාල ක්‍රියාමාර්ග ගැනීමටත්, වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඉ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් ප්‍රතිලාභීන් සඳහා වැඩිපුර ගෙවා තිබුණු රු.474,000ක් වූ වැඩිහිටි දීමනා, ආබාධිත හා වකුගඩු රෝග දීමනා 2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි.	අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැඩිපුර ගෙවා ඇති දීමනා අයකර කරමින් පවතින බව.	වැඩිපුර ගෙවීම් සිදු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, වැඩිපුර ගෙවා තිබුණු වැඩිහිටි දීමනා, ආබාධිත හා වකුගඩු රෝග දීමනා කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඊ)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 තුළ ක්‍රියාත්මක කර තිබුණු සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් ණයලාභීන් 4,736 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලබාදී තිබුණු රු.මිලියන 327.13ක්වූ ණය කල් පසු වී ඇති බවත්, ණයලාභීන් 1,475දෙනෙකු සඳහා ලබාදී තිබුණු රු.මිලියන 130.47ක් වූ ණය, බොල් ණය ලෙස හඳුනාගෙන ඇති බවත් නිරීක්ෂණය විය.	පිළිතුරු දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයෙන් ලැබුණු පසු ඉදිරිපත් කරන බව.	කාලීනව ණය අයකර ගැනීමට කටයුතු නොකල නිලධාරීන් සම්බන්ධ විධිමත් පරීක්ෂාවක් සිදු කිරීමටත්, කල් පසු වූ ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.
(උ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් දීර්ඝකාලීන බදු පදනම මත බදු දී ඇති ඉඩම් හා දේපල වලට අදාළව බදුකරුවන් 50දෙනෙකුගෙන් රු.මිලියන 11.51ක මුදලක් 2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි.	හිඟ බදු මුදල් අයකර ගැනීමට සහ චක්‍රලේඛ ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	කාලීනව බදු අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමත්, අදාළ බදු මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 අගෝස්තු 04 දිනැති අංක 04/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4.4 ඡේදය මගින්, 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු තිරසර සංවර්ධන ඉලක්කයන් සමඟ ගැලපීම අත්‍යවශ්‍ය වී ඇති බවත්, ආයතනයේ සියලුම අයවැයගත වියදම් වැඩසටහන් හා ව්‍යාපෘතීන්, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සමඟ ගැලපීම් කිරීමට කටයුතු කළයුතු බවත්, එම තොරතුරු තිරසර සංවර්ධන සභාව වෙත ඉදිරිපත් කළයුතු බවත් දක්වා ඇති නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයට අදාළව 263 අයවැයගත ප්‍රතිපාදන යටතේ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සමඟ ගැලපීමට කටයුතු කරන බව.	අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහජනතාවගේ ජීවිතවලට හා දේපලවලට විශාල තර්ජනයක්ව පවතින වන අලි මගින් වන හානි සඳහා ස්ථිර විසඳුමක් නොවීම හේතුවෙන් 2022, 2023 හා 2024 වර්ෂවලදී වන අලි පහර දීමෙන් ජීවිත හානි 26ක්, ශාරීරික හානි 23ක් සහ දේපල හානි 255ක් වාර්තාවී තිබුණු අතර, සිදුවූ හානි සඳහා වන්දි මුදල් ලෙස එකතුව රු.මිලියන 41.18ක් ගෙවා තිබුණි.	2022 සිට 2024 දක්වා මුළු ජීවිත හානි සංඛ්‍යාව 26ක් බව.	මහජනයා වෙත සංවේදී ගැටළුවක්ව පවතින වන අලි ගැටළුව විසදීම සඳහා තිරසර විසඳුමක් ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	වන අලි පහරදීම හේතුවෙන් ශාරීරික හා දේපල හානිවීම් සම්බන්ධ වන්දි සඳහා, අයදුම්පත් ලැබී වසර 1-3 ත් අතර කාලයක් ගතවී ඇති අයදුම්පත් 48 ක් සහ 2024 වර්ෂයේ ලැබී තිබුණු අයදුම්පත් 28 ක් සඳහා වනජීවී ස්ථානීය පරීක්ෂණ වාර්තා ලැබී නොමැතිවීම හේතුවෙන් ගෙවීම සම්බන්ධ ඉදිරි කටයුතු විගණිත දින වූ 2025 මාර්තු 31 දින වන විටත් ප්‍රමාද වෙමින් පවතින බව නිරීක්ෂණය විය.	අඩුපාඩු සම්පූර්ණ වූ පසු සහ වනජීවී වාර්තා ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකරන බව.	ආපදාවන්ට ලක්වූ මහජනතාව වෙත අප්‍රමාදව වන්දි ලබාදිය හැකි ආකාරයට සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.
(ඇ)	බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවාලාභී ප්‍රඥප්තිය අනුව දැව හෙළීම සඳහා අදාළ නිර්දේශ සහිත ඉල්ලුම්පත්‍රය ලැබී දින 07ක් තුළ බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කළයුතු වුවත්, ඉල්ලුම්පත්‍ර ලැබීමෙන් පසු දැව	අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේදී පැවති අඩුපාඩු හේතුවෙන් ප්‍රමාදයන් ඇති වී ඇති බව හා ඉදිරියේදී දැව හෙළීම්	කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ක්‍රියාත්මක පුරවැසි /

	හෙලීමේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මාස 03ත් මාස 5½ත් අතර, කාලයක් ගතවූ අවස්ථා පැවති අතර, 2024 ජුනි 24 විගණන දින වන විට 2023 මැයි 05 දින සිට 2024 ජුනි 03 අතර කාලය තුළදී භාරදී තිබුණු අයදුම්පත්‍ර 38 ක් සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.	බලපත්‍ර භාර ගැනීමේදී අඩුපාඩු රහිතව භාර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	සේවාලාභී ප්‍රඥප්තිය අනුව කටයුතු සිදුවන බව තහවුරු වන වැඩපිළිවෙලක් හඳුන්වා දීමත් කළ යුතුය.
(ඇ)	1989 මාර්තු මස 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/89 අනුව මහජනයාගේ පැමිණිලි සඳහා ක්‍රියාමාර්ග ගැනීම උපරිම සති දෙකක කාලපරිච්ඡේදයක් ඇතුළත අවසන් කළයුතු බව දන්වා ඇතත්, අම්බලන්තොට, හම්බන්තොට, කටුවන, තිස්සමහාරාම හා සූරියවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව ලැබී තිබූ මහජන පැමිණිලි 07කට අදාළව ගත් ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා කර නොතිබුණි.	මහජන පැමිණිලි සම්බන්ධව කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇති බව.	අදාළ විධි විධාන ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.

7. **මානව සම්පත් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සමාලෝචිත වර්ෂය අවසන් දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12හි අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු 26ක් හා අතිරික්තතා 117ක් පවතින බවත් සංවර්ධන නිලධාරී සහ සංවර්ධන නිලධාරී (සංවර්ධන) තනතුරු සඳහා නිලධාරීන් 268 දෙනෙකු අතිරික්තව සිටින බවත් නිරීක්ෂණය විය.	ඉදිරියේදී කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර පියවර ගන්නා බව හා අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව.	කාර්ය මණ්ඩල අවශ්‍යතාවන් යළි සමාලෝචනයට ලක් කොට ආයතනික අරමුණු කරා ළඟාවිය හැකි පරිදි විධිමත්ව කාර්ය මණ්ඩලය කළමනාකරණය සිදුකළ යුතුය.
(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12හි තාක්ෂණ නිලධාරීන් 27 දෙනෙකු (මධ්‍ය රජය හා පළාත් සභා) සහ කාර්මික සහකාර නිලධාරීන් 12දෙනෙකු අනුයුක්තව සිටි නමුත්, සම්පූර්ණ කාර්යාල 13 තුල එම නිලධාරීන් මනාව කළමනාකරණය කිරීම තුලින් වඩාත් කාර්යක්ෂම හා සඵලදායි සේවාවක් ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි. මෙම තත්ත්වය යටතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරියෙකු නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 28.75ප්‍රතිපාදන අනුමත වූ ව්‍යාපෘතීන් 09ක් සිදුකිරීමට නොහැකි වී තිබුණු බවත් නිරීක්ෂණය විය.	කාර්මික සහකාර නිලධාරීන් හා තාක්ෂණ නිලධාරීන්ගේ කාර්යාලගතව පවතින අසමතුලිතතාවය සම්බන්ධව ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	- එම -

(ඇ)	අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අනුමත කාර්ය මණ්ඩලය අනුව කාර්යාල කාර්ය සහායකයින් පස්දෙනෙකු සේවයේ යෙදී සිටියදී, කාර්යාල සේවක සේවයේ කටයුතු සඳහා බහු කාර්ය සහායකයින් 10 දෙනෙකු 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට 2024 ජුනි 26 දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. එකී කාලය තුළ එකතුව රු.මිලියන 3.57ක දීමනා ගෙවීම් කර තිබුණු නමුත්, එකී කාර්ය මණ්ඩලය, තනතුරු පුරප්පාඩු පවතින වෙනත් ආයතන වෙත යොමු කිරීමට කටයුතු නොකර, කාර්යාලයේ අතිරික්තව රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.	බහුකාර්ය සංවර්ධන සහායකින් අවශ්‍ය වන්නේදැයි විමසා ආයතනකට 20 පමණ ලිපි යොමු කර ඇති බව.	අතිරික්ත කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගතයුතු අතර, අතිරික්ත බහුකාර්ය සහායකින් විධිමත්ව වෙනත් ආයතන වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.